රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2019

මගේ අංකය : Pns/P8/02/18
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2019.05.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරු

**විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වංචාසහගත ලෙස, මියගිය විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම වැළැක්වීමේ අවස්ථා පුළුල් කිරීම**

විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ සහ වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක:19/2006, අංක:01/2008, අංක:11/2009, හා අංක:16/2009 චක්‍රලේඛවලට අමතරවයි. එම චක්‍රලේඛ මගින් ජීවිත සහතිකය ලබා ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක:09/2014 මගින් ජීවිත සහතික ලබා නොදෙන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප තාවකාලිකව නතර කිරීමට කටයුතු යොදන බවට උපදෙස් නිකුත් කර ඇත.

02. විදේශගතව ජීවත්වන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් ජීවිත සහතික ලබා ගැනීම සඳහා දැනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවිය යුතු ය.

03. දැනට පවත්නා මෙම ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂම කිරීම මගින් ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික ප්‍රජාව වෙත විවේකීව ජීවත්වීමේ අවස්ථාව සලසාදීම සඳහා පහත උපදෙස් නිකුත් කරනු ලැබේ.

04. ශ්‍රී ලංකාවේ ජීවත් වන විශ්‍රාමිකයින් මියයාම පිළිබඳ වාර්තා ලබා ගැනීම සඳහා විවාහ, උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන්ට මග පෙන්වීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති රෙගුලාසි ඇතුළත් අත්පොතේ 292 නියෝගය ප්‍රකාරව ක්‍රියාකිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් වග බලා ගත යුතුය. එකී 292 නියෝගය පහත දැක්වේ.

“රෙජිස්ට්‍රාර් විසින් මරණයක් ලියාපදිංචි කරන විට මියගිය තැනැත්තා ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටියේ ද යන්න අනලස්ව විමසා බැලිය යුතු ය. ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයෙකුගේ මරණයක් ලියාපදිංචි කළ විට ඒ බව බී73 දරණ පෝරමයේ ලියා (පිටපත් තුනකින් යුක්තව) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත (කොළඹ නගරයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත) නොපමාව වාර්තා කළ යුතු ය. මියගිය අය සතුව විශ්‍රාම වැටුප් කාඩ්පතක් තිබුණේ නම් හැකි හැම විටම එය ද ලබාගෙන වාර්තාව සමඟ යැවිය යුතු ය. පෝරමයේ 5වන කොටුව යොදා ගත යුත්තේ පහත කරුණු දැක්වීමට ය.

1. මරණය ලියාපදිංචි කිරීමේ ස්ථානයේ අංකය හා දිනය
2. විශ්‍රාම වැටුප් කාඩ්පතේ අංකය
3. මියගිය විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ගෙවූ කාර්යාලය”

උක්ත වාර්තාව රෙජිස්ට්‍රාර්වරුන්ගෙන් ලබා ගැනීමේ දී මියගිය විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය ඉහත තොරතුරුවලට අතිරේකව ලබා ගන්නා ලෙසත්, කොළඹ නගරයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට වාර්තා කරනු ලබන ඉහත බී 73 දරණ වාර්තාවේ පිටපතක් තමන් වෙත එවන ලෙසත්, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් තම පාලනයේ කටයුතු කරන රෙජිස්ට්‍රාර්වරු හා වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් ලබා දිය යුතු ය. මේ වාර්තාව සතියකට වරක් ලබා ගැනීම සුදුසු වේ.

05. ශ්‍රී ලංකාවේ පවතින මරණ ලියාපදිංචි කිරීමේ නෛතික ක්‍රියාවලියට අනුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම් පනතේ 46 (1) වගන්තිය ප්‍රකාරව ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ සිදුවන මරණ පිළිබඳ වාර්තාවක් සෑම ග්‍රාම නිලධාරීවරයෙකු විසින්ම එම ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අදාළ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු වේ. ඒ අනුව ග්‍රාම නිලධාරීන් විසින් රෙජිස්ට්‍රාර්වරුන් වෙත කිසියම් මරණයක් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමේ දී ද මියගිය තැනැත්තා ආණ්ඩුවේ විශ්‍රාම වැටුපක් ලැබූ අයෙක්දැයි විමසා බලා, එසේ නම් මියගිය තැනැත්තාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, විශ්‍රාම වැටුප් ගෙවූ කාර්යාලය ආදී තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත වාර්තා කළ යුතු වේ.

06. ඉහත අන්දමින් මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් හා ග්‍රාම නිලධාරීන් මඟින් ලැබෙන වාර්තා පරීක්ෂා කර බලා තම කාර්යාලයට අදාළ විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ ලේඛනය යාවත්කාලීන කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් නොපමාව ක්‍රියා කළ යුතුය. යම් හෙයකින් ඉහත වාර්තා මඟින් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් විශ්‍රාම වැටුප් ලැබූ විශ්‍රාමිකයෙකුගේ මරණය පිළිබඳ වාර්තා වුවහොත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත එම තොරතුරු දැන්වීමට ද ප්‍රාදේශීය ලේකම්වරුන් ක්‍රියා කළ යුතුවේ.

07. විශ්‍රාමිකයකු හෝ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු හෝ අබාධිත ප්‍රතිලාභියෙකු මිය යෑමෙන් අනතුරුව එම තොරතුරු නිසි පරිදි වාර්තා නොවීම හේතුවෙන් රාජ්‍ය මුදල් වෙනත් පාර්ශවයන් විසින් වංචනිකව ලබා ගැනීමේ සිද්ධීන් වාර්තා වී ඇත. එබැවින් ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කරනු ලබන අතර රාජ්‍ය මුදල් අවභාවිතය වළක්වාලීම සඳහා හැකි සෑම පියවරක්ම ගැනීම සඳහා මෙමගින් අවධානය යොමු කෙරේ.

08. විශ්‍රාමිකයෙකු හෝ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබන්නෙකු තම පදිංචිය හැර යන අවස්ථාවක දී හෝ විදේශගත වන අවස්ථාවක දී ඒ පිළිබඳ අදාළ ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත නොපමාව දැනුම් දීම සිදු කළ යුතු ය.

09. ඉහත සඳහන් පරිදි මියයාම්, පදිංචිය හැරයාම් හෝ විදේශගතවීම් නිසි පරිදි වාර්තා නොවීම හේතුවෙන් සිදුවන වැරදි සහගත ගෙවීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් පෞද්ගලිකවම වගකිව යුතු බව අවධාරණය කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**පිටපත්:**

01. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දිසාපතිවරුන්ගේ සමුළුවේ දී අවශ්‍ය දැනුවත් කිරීමට හා රෙජිස්ට්‍රාර් ජනරාල් මඟින් සියලු රෙජිස්ට්‍රාර්වරුන් වෙත මේ සම්බන්ධ තවදුරටත් උපදෙස් යොමු කිරීම සඳහා විධිමත් චක්‍රලේඛයක් නිකුත් කිරීම හා සම්බන්ධව තව දුරටත් උපදෙස් හා වගකීම් නිසි පරිදි යොමු කිරීම සඳහා

02. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් - මෙම චක්‍රලේඛය පරිදි ලැබෙන තොරතුරු නිසි පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම හා අවශ්‍ය උපදෙස් යැවීම